**5. ගාථාව**

**දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං,**
**යෙ චිත්තං සඤ්ඤමෙස්සන්ති - මොක්ඛන්ති මාරබන්ධනා.**

**පදගතාර්ථය**

| | |
|---|---|
| **දූරංගමං** | - බොහෝ දුර ගමන් කරන (ඉතා දුර ඇති අරමුණු ද ගන්නා) |
| **ඒකචරං** | - තනි ව හැසිරෙන |
| **අසරීරං** | - සිරුරක් නැති |
| **ගුහාසයං** | - හදවත හෝ ශරීරය නමැති ගුහාවෙහි නිදන |
| **චිත්තං** | - සිත |
| **යෙ** | - යම් කෙනෙක් |
| **සඤ්ඤමෙස්සන්ති** | - සංවරයෙහි පිහිටුවත් ද |
| **තේ** | - ඔවුහු |
| **මාරබන්ධනා** | - මාර බන්ධනයෙන් |
| **මොක්ඛන්ති** | - මිදෙත් |

**භාවාර්ථය**

ඉතා දුර ගමන් කරන්නා වූ තනි ව ම හැසිරෙන්නා වූ, සිරුරක් නොමැත්තා වූ සතර මහාභූතික ශරීරය හෝ හදවත නමැති ගුහාවෙහි වසන්නා වූ සිත යම් කෙනෙක් සංවර කර ගනිත් ද ඔවුහු මාර බන්ධනයෙන් මිදෙත්.

**නිදන කථාව**

සැවැත් නුවර වැඩවිසූ සංඝරක්ඛිත නම් රහතන් වහන්සේගේ නැගණිය පුත් කුමරෙකු ලැබ සොහොයුරු තෙරණුවන්හට ගරු කිරීම සඳහා ඔහුටත් සංඝරක්ඛිත යන නම තැබුවා ය. ඇය ඒ කුමරා හදු වඩා ඒ සොහොයුරු තෙරණුවන් වෙත ම පැවිදි කළා ය. ඒ සාමණේරයන් වහන්සේ භාගිනෙය්‍ය සංඝරක්ඛිත ය යි ප්‍රසිද්ධ වූහ. පසු ව උපසම්පදාව ලබා පිටිසර වෙහෙරක වස් එළඹියහ. එම ගමෙහි සැදැහැතියෝ වස් කෙළවර පිරිකර සඳහා සත් රියන් වතක් හා අට රියන් වතක් වශයෙන් පිළි දෙකක් භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියන්ට පූජා කළහ.

ඉන් අටරියන් වත තම ඇදුරු තෙරුන්හට පුදමි' යි සිතා ගත් භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියෝ උපාධ්‍යායන් වහන්සේ වෙත එළඹ වත් සපුරා අටරියන් පිළියෙන් ගුරුන් පුද පවන් සලමින් සිටියහ. ඇදුරු තෙරණුවෝ අල්පේච්ඡයහ. තමන් වහන්සේගේ තුන් සිවුරු සම්පූර්ණ ව තිබුණු හෙයින් වස්ත්‍රය නො පිළිගෙන බෑනණුවන් වූ භික්ෂුවට ම පැවරුවේ ය. මෙසේ දෙවන, තෙවන වර දක්වාත් එසේ කළ පසු භාගිනෙය්‍ය සංඝරක්ඛිත භික්ෂුව නො සන්සුන් විය. කලකිරුණේ ය. 'මුන් වහන්සේ ගිහි කල මාගේ මයිලණුවෝ ය. පැවිදි කල ගුරුවරයා ය. දැන් මා හා ආමිස පරිභෝගය නො කරති. මා පූජා කළ පිළි ඉවතලූහ. එහෙයින් දැන් මේ පැවිදි කමෙන් මට වැඩක් නැත. ගිහි වෙමි' යි සිතී ය. 'එහෙත් ගිහිගෙය කම්කටොලු සහිත ය. කුමක් කොට ගිහි ව දිවිපෙවෙත ගෙන යන්නෙම් ද' යි තෙරුන් වහන්සේට පවන් සලමින් ම සිතන්නට විය. 'මම ගිහි ව මෙම අට රියන් වස්ත්‍රය විකුණා එළදෙනක් ගෙන ඇ පැටවුන් වැදූ පසු කිරි විකුණා ධනය උපයා බිරිඳක් සරණ පාවාගන්නෙමි. පුතකු ලද කල ඔහුට තෙරුන් වහන්සේගේ නම තබා රියක නැගී බිරිඳත් දරුවාත් සමග තෙරුන් වහ්නසේ දැකීමට යන්නෙමි. එවිට බිරිඳගේ නො සැලකිලිමත්කමින් පුතු රියෙන් වැටී අනතුරක් සිදු වුවහොත් මෙසේ ඇගේ හිසට කෙවිටෙන් ගසන්නෙමි' යි කියා සිතනුයේ පවන් සලමින් ම තෙරුන් වහන්සේගේ හිසට අවානෙන් පහර දුන්නේ ය. මයිලණු තෙරහු ඔහුගේ සිතිවිලි බලා 'සංඝරක්ඛිතයෙනි, මාගමකට පහර දිය නො හැකි ව මහලු භික්ෂුවකට පහර දෙනුයේ උන් වහන්සේගෙන් සිදු වූ කවර වරදක් නිසා ද' යි පිළිවිසූහ. මෙයින් ලජ්ජාවෙන් මිරිකී ගිය භාගිනෙය්‍ය සංඝරක්ඛිත භික්ෂුව සිවුරු හැරදමා යාමට සිතා එතැනින් පලා ගියේ ය. තරුණ භික්ෂූහු ඔහු ලුහුබැඳ ගොස් අල්ලා ගෙන බුදුරජාණන් වහන්සේ හමුවට ගෙන ගියහ. බුදුරජාණන් වහන්සේ ද තොරතුරු විචාරා "සංඝරක්ඛිතයෙනි, ඔබ කිසිත් නො සිතව, සිත

වනාහි දුර වූ ද අරමුණු ගන්නා ගති ඇත්තකි. ඒ නිසා රාගාදි බන්ධනයෙන් මිදීම පිණිස උත්සාහ කරව" යි ඉහත ගාථාවෙන් දහම් දෙසූ සේක. එම දේශනාව අවසානයෙහි භාගිනෙය්‍ය සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ බොහෝ දෙනෙක් සෝවාන් ඵලයට පැමිණියහ.

සාධු ! සාධු !! සාධු !!!

ශ්‍රී සද්ධර්ම සංසදය
ධම්මාරාම යෝගාශ්‍රමය
(අධි පොසොන් 2551)

**සම්පාදක:** පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ,
පොල්ගස්ඕවිට, විපස්සනා භාවනා මධ්‍යස්ථානය.

**පිටු සැකසීම:** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**ධර්මදානය:** පින්වත් දයාසීලී උපාසිකා මාතාව හා පින්වත් උපේක්ෂා පියරංගිකා මෙනෙවිය විසින් අභාවප්‍රාප්ත ඥාතීන්ට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් තමන්ට ධර්මාවබෝධය පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්දයන් වහන්සේගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*

**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2007**